# සිරිධම්ම විද්‍යාලය
# SIRIDHAMMA COLLEGE

## 8 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පැවරුම 1

නම : - .......................................................          ශිෂ්‍ය අංකය - ....................

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*
- *දී ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.*

---

1. බෝසතානන් වහන්සේ බුද්ධත්වයට පත්ව උපන් ගමට වැඩම කළේ බුද්ධත්වයෙන් වසර,
   I. අටකට පසුවය          II. එකකට පසුවය
   III. දෙකකට පසුවය          IV. තුනකට පසුවය

2. බුදුන් වහන්සේ මහා මොග්ගල්ලාන සූත්‍රය දේශනා කළේ,
   I. අචිරවතී නදී තෙර අඹ වනයේදී ය          II. විශාලා මහ නුවර වන පියසකදී
   III. ගෝසිංහල නම් සාල වනයේදීය          IV. කලන්දක නිවාප නම් සොඳුරු වන පියසකදීය

3. බුදුන්වහන්සේ මහජන මතයට ගරුකළ බවට නිදසුනක් වන්නේ
   I. වේරංජාවෙහි වස් විසූ යව ධාන්‍යයෙන් යැපීම.
   II. දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන ලෙස ශික්ෂාවක් පැනවීම.
   III. උපතිස්ස කෝලිත දෙදෙනා පැවිදි කිරීම.
   IV. භික්ෂූන් වහන්සේලාට ධර්මට දේශනා කිරීම.

4. ධර්ම රත්නයේ ගුණ ගණන,
   I. 03 කි.          II. 06 කි          III. 24 කි          IV. 09 කි

5. දනමය පිංකමකදී කල්වේලා ඇතිව මුලින්ම කළ යුතු කාර්යය වන්නේ,
   I. ස්වාමීන් වහන්සේලාට ආරාධනා කිරීම
   II. පිරිකර ගෙන ඒම
   III. නෑහිත මිතුරන්ට ආරාධනා කිරීම
   IV. අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන ඒම

6. බුදු සසුනේ භික්ෂුණී ශාසනයට මුලින්ම එක්වූ පිරිස
   I. 500 කි          II. 400 කි          III. 501 කි          IV. 499 කි

7. සංඝ බේදයක් ඇතිකිරීම සඳහා පංච වරයක් ඉදිරිපත් කළේ
   I. මහා කාශ්‍යප තෙරුන්          II. උපාලි තෙරුන්
   III. අනුරුද්ධ තෙරුන්          IV. දේවදත්ත තෙරුන්

8. සෝණදණ්ඩ බමුණා දැක්වූ ආකාරයට “ සම්මෝදකය ” යනු
   I. විවෘත කතාබහ ඇත්තකු යන්නයි
   II. සතුටුසාමචි කථා ඇත්තකු යන්නයි
   III. පළමුවෙන්ම කථා කරන්නෙකි යන්නයි
   IV. කනට සුව එළවන කථාබහ කරන්නෙකි යන්නයි.

9. “කාලයක් නැතිවම” යන කවියෙන් දැක්වෙන්නේ ධර්ම රත්නයෙහි

i. සන්දිට්ඨික ගුණයයි II. ඕපනයික ගුණයයි

III. අකාලික ගුණයයි IV. ඒහිපස්සික ගුණයයි

10. තෙරුවන් ගුණ ගණන

i. 8 කි II. 24 කි III. 6 කි IV. 9 කි

11. “ වලයම” යන්න භාවිතා කරන්නේ

i. මංගල උත්සවවලදී II. අවමංගල උත්සවවලදී

III. දනමය පිංකම් IV. පිරිත් පිංකම්

12. සැරියුත් තෙරුන් වහන්සේ රහත් වූයේ

I. තිරෝකුඩ්ඩ සූත්‍රය අසා

II. ආදිත්ත පරියාය සූත්‍රය අසා

III. මහා ධර්මපාල ජාතකය අසා

IV. වේදනා පරිග්ගහ සූත්‍රය අසා

13. උපතිස්ස පරිවැජියාට “යේ ධම්මා හේතුප්පභවා” යන ගාථාවෙන් ධර්මය දේශනා කළේ

i. අස්සජි තෙරුන් II. අනුරුද්ධ තෙරුන්

III. වප්ප තෙරුන් IV. මහා කාශ්‍යප තෙරුන්

14. ධම්ම පදය නම් කෘතිය අයත් වන්නේ

I. දීඝ නිකායට II. අංගුත්තර නිකායට

II. ඛුද්දක නිකායට IV. සංයුක්ත නිකායට

15. ධම්ම පදයෙහි ඇති ගාථා ගණන

i. 423 කි II. 426 කි III. 550 කි IV. 438 කි

16. බුදුන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට නිවන් අවබෝධය පහසු කරවනු වදල ශික්ෂාවන් ඇත්තේ

I. අභිධර්ම පිටකයේ II. විනය පිටකයේ

III. පරිවාර පිටකයේ IV. සූත්‍ර පිටකයේ

17. බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය පිණිස විහාර වර්ග 05 ක් අනුමත කළේ

I. සුදත්ත සිටුවරයාගේ ඉල්ලීම මතය

II. රජගහ නුවර සිටුවරයාගේ ඉල්ලීම මතය

III. විශාඛාවගේ ඉල්ලීම මතය

IV. මහජනතාවගේ ඉල්ලීම මතය

18. ගණ දෙවියන්ට හා සරස්වතී දේවියට වට්ටියක් තබා ඉටුකරන උත්සවය

I. සරණ මංගල්‍යය II. නව නිවසකට ගෙවදීමේදී

III. උපන්දිනය IV. අතපොත් තැබීම

19. ගුත්තිල කාව්‍ය රචනා කරන ලද්දේ
   I. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
   II. වෑත්තෑවේ හිමි
   III. අලගියවන්න මුඛවෙට්ටිතුමා
   IV. වීදගම මෛත්‍රී හිමි

20. සෝණදණ්ඩ බමුණා වාසය කළේ
   I. සැවැත් නුවරය
   II. රජගහ නුවරය
   III. අඟුරට චම්පා නුවරය
   IV. කිඹුල්වත් නුවරය

---

## II කොටස

- *ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න*

---

01.
   I. බුද්ධ චරිතයෙන් පිළිඹිබු වන ආචාරශීලි ගුණාංග 02 ක් ලියන්න
   II. සිරිත් හා විරිත් යන්න අර්ථ දක්වන්න.
   III. සිව්වනක් පිරිස නම් කරන්න.
   IV. භාවනා වඩන විට පිරිමි දරුවන් සහ ගැහැණු දරුවන් වාඩිවී සිටිය යුතු ඉරියව් පිළිවෙලින් ලියන්න.
   V. බුදුගුණ සිහිකර වඩනු ලබන භාවනාව නම් කරන්න.

02.
   I. උපතේ සිට මරණය දක්වා සිදුකරනු ලබන චාරිත්‍ර 02 ක් නම් කරන්න.
   II. මංගල උත්සවයකදී සිදුකරන පෝරුවේ චාරිත්‍ර 03 ක් ලියන්න
   III. බෞද්ධ ආගමට අනුව අවමංගල අවස්ථාවකදී කළ යුතු දේ පැහැදිලි කරන්න.

03.
   I. දේවදත්ත කුමරුන් සමග පැවිදි වූ අනෙක් පිරිස නම් කරන්න.
   II. සංඝබේදය ඇති කිරීම සඳහා දෙව්දත් තෙරුන් විසින් ඉදිරිපත් කරන ලද පංචවරය නම් කරන්න.
   III. එම ගැටලුව විසදීමේදී බුදුන් වහන්සේ අනුගමනය කළ ක්‍රියාමාර්ගය කුමක්දැයි ලියන්න.

04.
   I. දහම් ගුණ ඇතුළත් පාඨය නිවැරදිව ලියන්න.
   II. එහි දැක්වෙන දහම් ගුණ පිළිවෙලින් නම් කරන්න.
   III. එම ගුණවල තේරුම ලියන්න.

05.
   I. බුදුන් වහන්සේ ජීවමාන සමයේ බුදුගුණ සිහිකරමින් ශ්‍රද්ධාවෙන් මියගොස් දෙව්ලොව උපත ලැබූ දෙදෙනා නම් කරන්න.
   II. බුදුගුණ භාවනාව වඩන අයුරු පියවර වශයෙන් ලියන්න.
   III. බුදුගුණ භාවනාවේ ආනිශංස 05 ක් ලියන්න.